

# පෙර පාසලෙන් පළමු වසරට

මව් ඇකයෙන් අලුත් ලොවකට පා තබන සුරතල් සිඟිති දරුවකු අකුරු කරන්නට හා හාපුරා කියා පාසල් යන මුල් ම දිනය, ඔහුට හෝ ඇයට ළමා වියේ අලුත් ම අත්දැකීමක් ලබාදෙන දිනය වන බවට සැක නැත. පිනි තැවරුණු හිමිදිරි පින්නේ පිපුණු සුදෝසුදුවන් පිච්චමල් පොඩිති මෙන් පිවිතුරු පුංචි දරුවන්ගේ ලෝකය විඳින්නට හැකිවන්නේ පුංචි එවුන් ගේ ම නෙතින් ලෝකය දකින්නට හැකි නම් පමණි.

හසරක් නොදැන ජීවිතයේ බිහිදොරින් පියමැන අලුත් ලෝකය දෙසට එබිකම් කරන පුංචි දරුවකු පරිපූර්ණ සොඳුරු මිනිසකු ලෙස හෙට ලොවට දායාද කළ හැකි වන්නේ ළදල්ලක් බඳු ළපටි මනස නොතලා නොපාරා සෙනෙහසින් පෝෂණය කළ විට දී ය. මව ගේ කිරි සුවඳට තුරුළුව ආදරයෙන් ගීතවත්ව සුරතල් වූ දරුවා ලෝකයට කළඑළි දක්වන්නේ පෙර පාසල හෝ පාසල තුළින් ය. සිඟිති වයසේ ආදරය රැකවරණය නොඅඩුව ලැබිය යුතු ම වන්නේ මව්පියන් වැඩිහිටියන් අතරේ ම ය. එතුළින් ලබන ආදරය දරුවා ගේ මනසට ඔසුවකි. මේ පුංචි මනසට ඔරොත්තු නොදෙන තරමේ යම් යම් වියවුල් දරුවාට විඳින්නට සිදුවුවහොත් දරුවා ගේ ඉදිරි පැවැත්මට හා පෞර්ෂවර්ධනයට එය තදබල පහරකි.

පාසලට යන මුල්ම දිනය ද දරුවාට ඉතා ප්‍රසන්න වටපිටාවකින් යුතු දිනයක් විය යුත්තේ එනිසා ය. නුහුරු පරිසරය හා මව පියාගෙන් වෙන්ව මඳක් හුදකලාව සිටීම ඇතැම් පුංචි දරුවන්ට ඔරොත්තු නොදෙන්නක් විය හැකි ය. දරුවකු පාසල් යන අවධියට ළඟාවන විට බොහෝ මව්පියන් දරුවා පෙර පාසලට ඇතුළත් කිරීමට උත්සුක වීම සාමාන්‍ය දෙයකි.

එසේ වුවද පෙර පාසල තුළින් හැඩගැසෙන දරුවා තුළ සිදුවන වර්ධනය පිළිබඳ යම් යම් ගැටලු සහගත තත්ත්වයන් ද මතුවිය හැකි ය. පෙර පාසල තුළින් ලබාදෙන්නා වූ අධ්‍යාපනික හා චර්යා හැඩගැස්ම සමස්තයක් වශයෙන් ගත් කළ කොතැනක පවතී ද යන්න කල්පනා කළ යුතුව ඇත. පෙර පාසලින් පාසලට එන දරුවා තුළින් යම් යම් ගැටලු සහගත චර්යාවන් විද්‍යාමාන වීම මෙහි ඇති බරපතල ගැටලුවයි. පෙර පාසල් හෙවත් මුල් ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන රටපුරා ව්‍යාප්තව තිබුණත් මෙහි ප්‍රමිතිය හා කාර්යභාරය කෙසේ විය යුතු ද යන්න මෙතෙක් බොහෝ දෙනා පැහැදිලිව හඳුනා නොගත් තත්ත්වයකි.

මුලින් ම පාසලට පැමිණෙන ඇතැම් දරුවන් ළමා වියේ හුරුබුහුටිකම් ඉක්මවා ගිය බවත් දක්නට ලැබෙන්නේ මවක ගේ ආදරය රැකවරණය ඇවැසිම වයසේ දී මවගෙන් දුරස්කොට, පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානවලට ළදරුවන් යොමු කිරීමේ ඵලවිපාකයන් වශයෙන් බව මේ වන විට පෙනී ගොස් අති කරුණකි. මුල් අවධියේ දී දරුවකු මූලික වශයෙන් යොමු කළ යුත්තේ දරුවා ගේ "හසුරු කුසලතා" වර්ධනය සඳහා ය. පැන්සල හසුරුවන ආකාරය, ඇඟිලි ක්‍රියාකාරිත්වය, කතුරක් භාවිතයෙන් පින්තූර කැපීම, ඇලවීම, පින්තූර පාට කිරීම ආදී වශයෙන් වූ කුසලතා වර්ධනය කිරීම මිස අකුරු ඉගැන්වීම නොකළ යුත්තේ, මෙම අවධිය වන විට දරුවකුට මනෝ විද්‍යානුකූල සැහැල්ලු අධ්‍යාපන රටාවක් ලබා දීම මිස මනසට බර වැඩි දෙයින් අයහපතක් ම වන නිසාවෙනි.

පෙර පාසලින් අකුරු ලියන්නට හුරු වූ බොහෝ දරුවන් පාසලට පැමිණිවිට එය නිසියාකාරව පුහුණු වී නැති බවක් පෙනෙන්නට ඇත. පැන්සල රඳවා ගන්නට ඔවුහු වැරදි ඇඟිලි භාවිත කරති. අකුරු ලිවීමට හුරු වී තිබුණත් පටන් ගැන්මේ දී වැරදි හුරුවක් ඇති බව පෙනේ.

එකිනෙකා අතර පවත්නා "යහජීවනය" බොහෝ දරුවන් තුළ අද දක්නට නොලැබෙන තත්ත්වයන් වී ඇත. පැහැදිලි හේතුවක් පෙන්වාදිය නොහැකි වුවත් අසූව දශකයෙන් පසුව පාසල් දරුවන් තුළ පැහැදිලිවම යහපත් ගතිපැවතුම් වලින් දුරස්වීමක් සිදු වූ බව ගවේෂණශීලී ගුරුභවතුන්ගේ ආකල්පය යි. ඇතැම් විට විවෘත ආර්ථික රටාව තුළින් මෙරට සමාජයට කළ බලපෑම් අනුව තත්ත්වය එසේ වූවා නම්, දරුවන් රූපවාහිනිය වටා ආසක්ත වීම වැනි දේ එයට වක්‍රව හෝ බලපාන්නට ඇති බව ඔවුන් ගේ මතය වී තිබේ.

මේ හේතුවෙන් පංතියේ සම වයසේ දරුවන් සමඟ යම් යම් දේ හුවමාරු කර ගැනීම හා අන්නෝන්‍ය සුහදතාව පවා ඉතා අඩු මට්ටමක පවතී. පෙර පාසලින් පසුව පාසලට එන බොහෝ දරුවන් ගේ සවන්දීමේ හැකියාව ද අද වන විට ඉතා දුර්වල මට්ටමක පැවැතීම කනගාටුවට කරුණකි.

පංති කාමරය තුළ දී ගුරුවරිය ගේ විධාන හා ඉල්ලීම් නොසලකා හැරීම මේ දරුවන් තුළ බොහෝ දුරට දක්නට ලැබෙන ලක්ෂණයකි. පෙර පාසලට යොමු කරන දරුවාට ප්‍රධාන වශයෙන් අකුරු ලිවීමේ හා කියැවීමේ හැකියාවක් ලබා දෙන ලෙස බොහෝ මව්පියෝ පෙරැත්ත කරති.

ඔවුන් සිතන්නේ දරුවාට හොඳින් ලියන්නට කියවන්නට හැකි වීම සැබෑ දක්ෂකමක් ලෙස යි. දරුවා පසුගාමී දරුවකු වේ යැයි අනියත බියකින් පසුවීම මෙයට හේතුව වී ඇත.



මෙම ආකල්පය මනෝ විද්‍යානුකූලව ක්‍රම ක්‍රමයෙන් පෝෂණය කළ යුතු ළමා මනස කුරුවල් වීමක් හා එයට දැරිය නොහැකි අන්දමේ පීඩාවක් බව නොසිතීම සැබැවින්ම අනුවණකමකි.

තවත් අතකින් බලන විට ළදරු විය හුදෙකලාව ගෙවී යන දරුවෝ බොහෝ විට හුදෙකලාව පාසලේ දීත් ගත කිරීමට පෙළඹෙති. බොහෝ විට අනෙක් දරුවන් කොනිත්තීම සපාකෑම වැනි ක්‍රියාවල ද නිරත වන්නේ මේ ආකාරයෙන් ඇතිවන පීඩනයේ අතුරුඵල ලෙසිනි. අද යුගයේ මව්වරුන් කාර්යය බහුල වීමද මෙයට මූලික හේතුවක් වී ඇත. මල් පියල්ලක්වත් ළමා මනස සංවර්ධනය කිරීම සඳහා ප්‍රවේසමෙන් වැඩි අවධානයක් යොමු නොකළහොත් මතු දවසක එය රටට මෙන්ම සමාජයට ද විසැඳිය නොහැකි ගැටලුවක් වන බව සිහිතබා ගත යුතු කරුණකි.

ළමයින් යනු ජාතියක සම්පතයි. මේ මිණිමුතු කැට නිසි අයුරින් ඔප මට්ටම්කර ලෝකයට තිළිණ කරන මුල් ළමා විය සුරැකීමේ මධ්‍යස්ථාන හෙවත් පෙර පාසල් සඳහා ක්‍රමවත් පුහුණුවක්, ප්‍රමිතියක් මෙන්ම ඇගැයීමක් කිරීම අපේ රටේ වගකීමයි. දරුවකු තුළින් දැකිය යුත්තේ ළමා ලෝකය මිස වැඩිහිටියන් ගේ කර්තෘ වූ පැසුණු ලෝකය නොවේ. එසේ හෙයින් දරුවකුට මව ගේ උණුසුම සුරතලය රිසිසේ විඳගැනුමට ඉඩහරිනු මිස ඉතා කුඩා ළදරු වියේ දීම ඉගෙනුම සඳහා සිරකර තැබීම නොකළ යුතු ය. අඩුම තරමේ පාසල් යන්නට මාස හයකට පමණ කලින් පෙර පාසලකට දරුවා ඇතුළත් කිරීම සෑහෙන බව පළපුරුදු පාසල් බාලාංශ ආචාරයවරියන් ගේ මතය වී ඇත.

එලෙසම පෙර පාසලකට නොගොස් කෙළින් ම පාසලකට යොමු කරන දරුවා අනෙක් දරුවන්ටත් වඩා හොඳින් නම්‍යශීලි ලෙස හැසිරවිය හැකි ආකාරයක් දැකිය හැකි බව දිගු කාලීන පලපුරුද්ද තුළින් ඔවුන් දරන ආකල්පය වේ. කොටින්ම කියතොත් තමන්ට අවශ්‍ය ආකාරයට දරුවා මට සිලිටු නම්‍යශිලි ලෙස හසුරුවාගත හැකි බව ඔවුහු පවසති.

කෙසේ වුවද නිදිමත එනතුරු, බත ඉදෙන තුරු අම්මාට සුරතල් වී පැරැණි කවියක් කතන්දරයක් රසවිඳින්නට ඇති අවස්ථාව වත්මන් පරපුරේ දරුවන්ට අහිමිව ගොස් බොහෝ කල්ය. එම නිසාම දරුවා, අසා සිටීමේ සවන්දීමේ හැකියාවන් පුරුද්ද මෙන්ම කලාත්මක රසවින්දනයෙන් ඈත් වී යාම අරුමයක් නොවේ. අද අලුත් පරපුරේ අම්මලාවීම ද තරුණ වියේ අඩු වයසින් යුතු පිරිසක් ද මෙයට බලපාන හේතුවකි. ඔවුන් තුළ ද ඇති ජීවිත අත්දැකීම් විරල ය. ඔවුන්ගෙන් දරුවන්ට ලැබෙන්නේද නවීන යුගයේ අත්දැකීම් ය. අනවශ්‍ය පරිදි රූපවාහිනියට ඇබ්බැහිවීම හා ග්‍රහණය කරගත් දරුවා කල්පනා කිරීමේ හා රසවිඳීමේ හැකියාවෙන් ඉවත්ව මායාකාරී දේ අත්විඳීමට පුරුදු වීම තවත් ගැටලුවකි.

යහපත් දරුවකු හොඳ පුරවැසියකු කිරීමට පෙර පාසල හෝ පාසල පමණක් ප්‍රමාණවත් නොවේ. සමාජය පරිසරය මෙන්ම යහපත් දෙමාපිය වැඩිහිටියන්ගේ ද උපකාරය ඒ සඳහා අවශ්‍යය.

හිරු කිරණක් සේ ප්‍රභාමත් පිරිපුන් සංවේදී දරුවකු රටට දායාද කිරීම ඒ සඳහා වගකිවයුතු කාගේත් වගකීමක් මෙන්ම එහිලා කොටස්කරුවන් වන සැමගේ ද පරම යුතුකමක් වන බව තරයේ සිහි තබා ගත යුතු කරුණකි.

පෙර පාසලකට නොගොස් කෙළින් ම පාසලකට යොමු කරන දරුවා අනෙක් දරුවන්ටත් වඩා හොඳින් නම්‍යශීලි ලෙස හැසිරවිය හැකි ආකාරයක් දැකිය හැකි බව දිගු කාලීන පලපුරුද්ද තුළින් ඔවුන් දරන ආකල්පය වේ. කොටින්ම කියතොත් තමන්ට අවශ්‍ය ආකාරයට දරුවා මට සිලිටු නම්‍යශිලි ලෙස හසුරුවාගත හැකි බව ඔවුහු පවසති.

**කොට්ටාව ධර්මපාල මහ විදුහලේ**
**ආචාරිනී තනුජා අලවත්තේගම මහත්මිය**

**සටහන**
**නන්දි අලුත්ගේ**

